### ජනප්‍රියම ගී ඔබ සතුව කොපමණ තියෙනවද?

ඇල්බම් කරන කාලේ ගීත 16 කළොත් 12 විතර ජනප්‍රියම තලයට ගියා. ගණන් කරලා නෑ. නමුත් ගීතවලින් හතරෙන් තුනක් විතරවත් ඇති ජනප්‍රිය ගීත. මෑත කාලයේ කරපු ගීතත් මිනිසුන් අතරට ගියා. මං දන්නේ නෑ මොකද්ද හේතුව, වෙලාව කියන එක. මං පොඩි දෙයක් කළත් ඒක මිනිස්සු අතරට යනවා, ඔවුන්ගේ කතා බහට ලක් වෙනවා. වාසනාවක් වෙන්නැති. අනික මං මෙච්චර කාලයක් පවත්වාගෙන ආපු දේ ඉස්සරහට පවත්වාගෙන යන්න මං මහන්සි වෙනවා. දැන් මං ජනප්‍රිය-යි කියලා නිකං ඉන්නේ නෑ. සංගීතය ඉගෙන ගන්නවා තාමත්. යාවත්කාලීන වෙන්න මං උත්සාහ කරනවා නිතරම.

### බොහෝ දෙනෙක් කියන නාලිකාවලින් ගීත ප්‍රචාරය කරන්නේ නෑ කියන කාරණාව ඔබට බලපෑවේ කොහොමද?

අනේ මන්දා. ගීතවලට විෂුවල් කළ යුතුයි කියලා කියනවා. හැබැයි මගේ සමහර ගීතවලට කිසිම රූප රචනාවක් කරලා නෑ. නමුත් මිනිස්සු අතරට ගියා. අනික නාලිකාවලින් ගීත නොගහ හිටියා කියලත් මට කියන්න බැහැ. ඒකයි මං කියන්නේ ඒක වෙලාව හෝ වාසනාව වෙන්නැති කියලා. සමහරු ගීතයක් හිට් කරගන්න සල්ලි වියදම් කරන්න මහන්සි වෙනවා. නමුත් මට එවැනි ප්‍රශ්න බලපෑවේ නෑ. මිනිස්සු මගේ ගීතවලට, හඬට ආදරේ කරන කන් මගේ ගීත අහයි. තව කෙනෙක් පරයා යන්න උවමනාවක් හෝ ලෝභ කමක්, තණ්හාවක් මගේ හිතේ නෑ. ඉතින් මං ඉන්නේ හරිම නිවිච්ච මනසකින්. ඒ නිසාම අර වැනි දේවල්වල මට අදාළ තාවක් නෑ.

### මුලින්ම ගීත ගැයූ කාලය මතකද?

ප්‍රසංගවලට කලින් විවාහ උත්සව සහ අනෙකුත් උත්සවවල මට ගීත ගයන්න අවස්ථාව ලැබුණා. ඒ කාලේ ඒවායින් මට දාහ එක්දහස් පන්සීය වගේ ගණන් ලැබිලා තියෙනවා. මං ඉගෙනගන්න කාලේ. අපි හුඟක් දේවල් තිබ්බ පවුලක් නෙමෙයි. ඉතාම සාමා-න්‍ය පවුලක්. මධ්‍යම පන්තියටත් පහළ කියලා කිව්වොත් හරි. තාත්තා විතරයි හම්බ කළේ. ඒකත් ලොකු මුදලක් නෙමෙයි. අපි දරුවෝ හතර දෙනෙක් එක්ක ගෙවල් කුලී ගෙවාගෙන ලයිට් බිල් ගෙවාගෙන, ඉස්කෝලවල වියදම් දරාගෙන බොහොම සාමාන්‍ය ජීවිතයක් ගත කළේ. අලුත් අවුරුද්දේ අලුත් පන්තියට යද්දී අපි හතර දෙනාගේම උවමනා එපාකම් අම්මා කළේ හරි අමාරුවෙන්. දැන් කාලෙත් දෙමව්පියෝ එහෙමනේ. ඉතිං ඒ කාලේ අපිටත් එහෙමයි. බොහොම අරපිරිමැස්මෙන් තමයි අම්මා දේවල් කළේ. අපිට කියලා ගෙයක් තිබුණේ නෑ. කුලියට හිටියේ. හුඟක් අමාරු කාලයක් අපේ ජීවිතවලට උදා වෙනවා. ඉන් පස්සේ තාත්තා රට ගියා. මාවරමන්ඩියේ තමයි අම්මා ඉස්සෙල්ලම ඉඩම් කෑල්ලක් අරන් ගෙයක් හැදුවේ. ඉතිං මං බස් එකේ ගිහින් ගීත ගායනා කරලා එනවා. එක්කෝ මගේ මාමා කෙනෙක් හරි කවුරුහරි බයික් එකේ එක්ක ගිහින් එක්ක එනවා. මගේ සපත්තු දෙක යුනිෆෝම් එක වගේ දේවල්වලට අම්මට මං මගේ සල්ලි දෙනවා. පස්සේ පස්සේ මං හම්බ කරන්න පටන් ගන්න කාලේ වෙද්දී ගෙදර තත්ත්වේ ටිකක් හොඳ අතට හැරිලා තිබුණා.

### ඔබව ගායිකාවක් කරන්න මහන්සි වුණේ කවුද?

අම්මා. ඇත්තටම අම්මට තිබුණු උවමනාව මට නං පොඩ්ඩක්වත් තිබුණේ නෑ. අම්මා බන්දුල පද්මකුමාර මහත්මයාව කොහොමින් හරි අඳුරගෙන තිබුණා. දවසක් එයා අම්මට කියලා තිබුණා දුවව එක්කරගෙන එන්න පොඩි ආර්ටිකල් එකක් කරමු කියලා.

එදා ඒ ගමන ගියාම මයිකල් පෙරේරා කියන ගායකයා එතෙන්ට ඇවිත් හිටියා ප්‍රසංගයක් ගැන විස්තර පත්තරේ දාන වැඩකට. ඒ පාර බන්දුල මහත්මයා එයාට කිව්වා, මේ ළමයා හොඳට සින්දු කියනවනේ දාන්නකෝ මෙයාවත් ෂෝ එකකට කියලා. මට ඉතින් මගේ සින්දු තිබ්බේ නෑ. අම්මා ඒ පාර කිව්වා හින්දි දෙමළ ගීත එහෙම ගයනවා කියලා. ඒ පාර මයිකල් පෙරේරා මට එන්න කිව්වා ප්‍රසංගයකට. කීයක් ගෙවනවද, ඒවා දන්නේ නෑ මුකුත්ම.

### මේ ඔබේ පළවැනි ප්‍රසංගය ?

ඔව්. මට අවුරුදු 16 ක් ඇති. මීරිගම

ප්‍රසංගයක්. නීල් අයියා එහෙම ඉන්න ඒ කාලේ ජනප්‍රියම බෑන්ඩ් එක සන්ෆ්ලවර් ඒ ප්‍රසංගයේ හිටියා. පළවැනි සෙෂන් එක බිලූ ෂැඩෝස්. මාව දැම්මේ එයාලත් එක්ක. එතන හිටියා ටෝනි හසන්. එයා මාව දැකලා තිබුණා වෙඩින්ග්ස්වලදී එහෙම ගීත ගයනවා. එයා නීල් අයියට එතැනදී කියලා තිබුණා. බලන්නකෝ මේ කෙල්ල සිංග් කරනවා හරිම දක්ෂයි කියලා. මගේ කකුල් දෙකත් එක්ක ගැහෙනවා. ඇයි ලොකු ඕඩියන්ස් එකකට සිංග් කරන්නේ. මං සිංග් කරලා ඉවර වුණාම නීල් අයියා මගේ ඔලුවට අත තියලා කිව්වා නංගි ඔයා මාර ලස්සනට සිංග් කළා. හිතා ගන්නවත් බෑ කියලා, මට සුබ පැතුවා හොඳ ගායිකාවක් වෙන්න කියලා. එදා මට රු. 500 ක මුදලක් හම්බුණා. ඊට පස්සේ මට හිතා ගන්නත් බැරි වුණා. හැම එකකට ආරාධනා ලැබුණා. ආයේ ඉතින් නැවතීමක් තිබුණෙම නෑ.

### පළවැනි ගීතය ?

92 මං ඉස්කෝලෙන් අවුට් වුණා. සිත හඬයි පළවැනි සිංදුව 93 කළේ. පළවැනි කැසට් එක ජනප්‍රිය වුණා. ඊට පස්සේ ඒ වගේ කැසට් පහක් විතර කළා. පස්සේ මට හිතුනා හින්දි දෙමළ කොපි ගීත කරන්න ඕන නෑ, මට මගේම ගීතයක් කරන්න ඕන කියලා. ඔස්ටින් සර් ගාව තමයි මං සංගීතය ඉගෙන ගත්තේ. ඒ හින්දා ඔස්ටින් සර් මට පුන්සඳ? ට ගීතය කරලා දුන්නා. රත්න ශ්‍රී අයියව මං දැකලාවත් තිබුණේ නෑ මේ ගීතය කරද්දී. පුන්සඳ? ට ගීතය වෙන ගායිකාවට දීලා තිබුණේ. ඇයට කතා කළාම ඇය මේ ගීතය මට දෙන්න කැමැති වෙලා තිබුණා.

### ඔබේ හැකියාව හෙළිදරව් කරගත්තේ කවුද?

අපේ අම්මට හොඳට සිංදු කියන්න පුළුවන්. අම්මගේ ලොකු හීනයක් තිබුණා ගායිකාවක් වෙන්න. නමුත් ඇයට ඒකට පරිසරයක් තිබුණේ නෑ. අම්මගේ පවුලේ හැමෝටම හොඳට සිංග් කරන්න පුළුවන්. අම්මට තරමට බැරි වුණත් තාත්තටත් හොඳට

සිංග් කරන්න පුළුවන්. හොඳ දැනුමක් තියෙනවා සංගීතය ගැන. මට අවුරුදු දෙකක් විතර වයසේදී අම්මයි තාත්තයි දුහුළු මලක් චිත්‍රපටය බලන්න ගිහින් තියෙනවා. ගෙදර ඇවිත් බොඳ මීදුම් ගීතය මතක් කරලා තියෙනවා ලස්සන ගීතයක් නේ මොකක්ද ඒක කියලා. මට වචන කියන්න බැරි වුණත් ඒ ගීතයේ තාලය මම මුමුණලා තියෙනවා. අම්මට එදා ඇස් දෙකට කඳුළු ආවලු. අම්ම හිතුවලු කමක් නෑ අම්මට නැති වෙච්ච සිහිනය කවදාහරි මගෙන් සැබෑ කරගන්න පුළුවන් වෙයි කියලා.

### ඔබ දැන් ක්ෂේත්‍රයේ අවුරුදු 25 ට වැඩියි?

ගුවන් විදුලි සංස්ථාවේ ළමා අංශයේ ඔඩිෂන් එකකට මං යන්නේ ඔස්ටින් සර් හරහා. එතනින් තේරෙනවා මාව ළමා ගායිකාවක් විදිහට. ඒ පටන් ගත්ත ජීවිතේ දැන් අවුරුදු තිහකට වැඩියි. මගේම ගීත ගත්තොත් අවුරුදු 25ක් විතර ඇති ක්ෂේත්‍රයේ.

### ඒ කාලේ ඔබේ සිහිනය?

මං ආසාවෙන් හිටියා ගුරුවරියක් වෙන්න. මගේ හිතේ හිටියේ අපේ ඉස්කෝලේ හිටපු ගෘහ විද්‍යා ගුරුවරිය. හරිම වසයි. හැබැයි හරිම ආදරෙයි. හැමෝම මට කතා කළේ විරාජිනී කියලා. එයා මට කතා කළේ ලාලිත්‍යා කියලා. ඒ ගුරුවරියගෙන් තමයි මං ජීවිතේ හුඟක් දේවල් ඉගෙන ගත්තේ. ගෑනු දරුවෙක් දැනගත යුතු බොහෝ දේවල් ඇය මට කියා දුන්නා. ඇය වගේ ගැහැනියක් සහ ගුරුවරියක් වෙන්නයි මට ඕන වුණේ. මං මගේ ජීවිතේ හීන ඔක්කොම හැබෑ කරගත්ත කෙනෙක්. කාලය එහා මෙහා වෙන්න පුළුවන් නමුත් ඕනම කියලා හිතපු හැමදේම ළඟා කරගත්ත කෙනෙක් මං.

### ඒ කාලේ ඔබ පෙම්වතියක්ද?

කතෝලික බාලිකාවල මං ඉගෙනගත්තේ. අනික ගෙදර වැඩිමල් දරුවා විදිහට ලොකු වැඩ කොටසක් පැවරුණා. ගායිකාවක් වෙන්න, සංගීතය ඉගෙන ගන්න හීන තිබ්බා. මේ ඔක්කොම එක්ක ප්‍රේම සම්බන්ධතාවකට ඉඩක් තිබුණේ නෑ මට. ඕලෙවල් කාලේ මං විද්‍යාවට දුර්වලයි. ඒ හින්දා අම්මා එකම පන්තියකට විතරක් මාව දැම්මා, ඒ විද්‍යාව පන්තිය. යාළුවෙක් ගේ ගෙදරවත් මාව තනියෙන් යැව්වේ නෑ අම්මා. නංගිලට එහෙම ඒ නිදහස තිබ්බා. අම්මා හිතුවද දන්නේ නෑ මං ඒ කාලෙ ඒ වගේ සම්බන්ධෙක පැටලිලා බලාපොරොත්තු වූ ගමන නොයා ඉඳියි කියලා. ඉතිං ඒ ලෙවල් කරලා ප්‍රතිපල එන්න කලින් අම්මගේ උවමනාවට මං ඉන්දියාවේ ගියා. අම්මට ඕන උනා මට කර්ණාටක් සංගීතය උගන්වන්න. මං ඉන්දියාවේ ඉද්දී, නිවාඩුවට ආවම තමයි ගීත කළේ. ඉතිං ලංකාවට එද්දී හොඳටම ජනප්‍රිය වෙලා මාව.

### ඉස්සරහට ජීවිතේ වෙනසක් වෙයිද ?

ජීවිතේ වෙනසක් වෙන්න තියෙනවා නම් වෙයි. හිත ගැන කියන්න අපිට බැහැනේ. දුක හිතෙන දෙයක් වුණොත් දරාගන්න පුරුදු වෙලා ඉන්නවා. සතුටු හිතෙන දෙයක් වුණොත් උපේක්ෂාවෙන් භාර ගන්නවා. මෙච්චර කල් පුද්ගලික වගේම වෘත්තීය ජීවිතෙන් මං ඒ දේවල් ඉගෙනගත්තා.

### ජීවිතේ සිදුවුණ සිදු නොවුණ දේවල් ගැන පසුතැවෙනවද?

මගේ ජීවිතේ කිසිමදේකට මම පසුතැවෙන්නේ නෑ. දුක හිතුනු සතුටු හිතුන වෙලාවල් විටෙක හිත උඩට එනවා. හැබැයි ඒක මොහොතින් යටපත් කරලා ජීවිතේ ඉදිරියට යන්න මට පුළුවන්.

